වාරිමාර්ග දෙපාර්තමේන්තුව
நீர்ப்பாசனத் திணைக்களம்
IRRIGATION DEPARTMENT
(HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation } 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax } 011-2591125
ලිපිනය / முகவரி / Address } 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07. 230, த.பெ.1138,பௌத்தாலோகமாவத்தை, கொழும்பு 07,இலங்கை 230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General) } 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெய்ல் முகவரி / E-mail Address } ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site } www.irrigation.gov.lk

මගේ අංකය / எனது இல / My No. } HYG/W/1 ඔබේ අංකය / உமது இல / Your No. } දිනය / திக / Date } 2021.05.13

**ගංවතුර අනතුරු ඇඟවීමේ නිවේදනය** **වර්ණය - ඇම්බර්**

**අත්තනගලු ඔය ද්‍රෝණිය සඳහා වූ නිවේදන - අංක 01**

**දිනය :- 2021/05/13 වේලාව :- ප.ව. 11.00**

අත්තනගලු ඔය ද්‍රෝණියේ ධාරා ප්‍රදේශ වලට පසුගිය පැය කිහිපය තුළ සැළකිය යුතු වර්ෂාපතනයක් ලැබී ඇති බැවින් අත්තනගලු ඔයෙහි ජල මට්ටම් ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. එම ගංඟාවෙහි වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරනු ලබන දූනමලේ ජල මිනුම් ස්ථානයේ ජල මට්ටම් සංසන්දනාත්මකව පහත දැක්වේ.

| ජල මිනුම් ස්ථානය | සුළු ගංවතුර මට්ටම | මහ ගංවතුර මට්ටම | 2021/05/13 දින ප.ව. 11.00 ට පවතින ජල මට්ටම |
|---|---|---|---|
| දූනමලේ ජල මිනුම් ස්ථානය | 4.4 m | 5.50 m | 4.29 m |

එමෙන්ම මෙම ගංඟාවෙහි ධාරා ප්‍රදේශයට අද පස්වරුව තුල මි.මී. 150 ඉක්මවා වැසි ලැබී ඇති අතර තව දුරටත් රාත්‍රී කාලයේද වැසි ඇතිවිය හැකි බවට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනතුරු ඇඟවීම් අනුව පෙනී යයි. මෙම තත්වය අනුව අත්තනගලු ඔය ද්‍රෝණියේ ගංවතුර සම්බන්ධයෙන් **ඉදිරි පැය කිහිපය තුළ** පහත සඳහන් ප්‍රදේශ වල ජනතාව **දැඩි අවධානයකින් පසුවිය යුතු බවට මෙමඟින් අනතුරු අඟවනු ලැබේ.**

**ගම්පහ, මිනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තනගල්ල, ජා ඇල, කටාන, මහර යන** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල අත්තනගලු ඔය ආශ්‍රිත පහත් බිම් වල සුළු ගං වතුර තත්වයක් ඇතිවීය හැකිය. එබැවින් එම ප්‍රදේශවල පදිංචි ජනතාවට හා මාර්ග භාවිතා කරන්නන්ට දැඩි අවධානයෙන් පසුවන ලෙසත් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ඉල්ලා සිටිනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අදාල ප්‍රදේශවල මහජනතාවගේ සහ ආපදා කළමනාකරණයට අදාල ආයතන වල අවධානය යොමු විය යුතු බව කාරුණිකව දන්වා සිටිමු.

**ඉංජි. එස්.පී.සී. සුගීශ්වර**

වාරිමාර්ග අධ්‍යක්ෂ ( ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ )